For private circulation only

# THE WAND

ORGAN OF THE SRI LANKA MAGIC CIRCLE

The Official Guardian of Magic

Decemberber 2017

President and the Council of
The Sri Lanka Magic Circle

Wishing All Members The Magic of Christmas!

& A Happy New Year







**ANNUAL GENERAL MEETING WILL BE HELD ON SUNDAY 11TH FEBRUARY 2018**

Magic Dealer
from Hydrebad Ashok Kumar will be there
at next meeting.
Details on page 5


Edited by Devsiri Fernando 7 Francisco Place, Moratuwa Tel: 2645927

## a walk down Memory Lane with HDN.............History of Magic XV මයා කලාවේ ඉතිහාසය XV

### 'The Greatest Show on Earth' and the 'Barnum Effect'



Phineas Taylor Barnum 19 සියවස විසු ඇමෙරිකානු ජාතිකයෙකි. ප්‍රායෝගික වෙළඳ ප්‍රචාරක කලාවේ කෙල පැමිණියෙකි. මිනිසුන් අසන්නට දකින්නට අසාකරන දේ පිළිබඳව සහජ ඉවකින් ඔවුන්ගේ කුතුහලය අවුස්සා තම මඩිය තරකර ගැනීමේ කලාව මැනවින් දත් අයෙකි. බොරුවෙන් කපටිකමින් රවටා මුදල් ඉපයීම පිළිබඳව කිසිම ලැජ්ජාවක් හෝ පසුතැවිමක් ඔහු තුල නොවිය. සර්කස් සහ අනෙකුත් ආකර්ෂණිය අංග ප්‍රදර්ශනය කරමින් නගරයෙන් නගරයට සහ රටින් රට සංචාරය කරමින් රාජ රාජ මහා මාත්‍යාදීන් ගේ ප්‍රසාදය දිනාගත් ලොව ප්‍රකට ධනවතෙකි. තමන්ගේම කෞතුකාගාරයක් ගොඩ නැගුවෙකි. කෙටියෙන් සඳහන් කළහොත් 'සැබෑ දක්ෂයෙකි.. දේශපාලනය සඳහා ද ඉදිරිපත් වූ ඔහු 'ඩිමොක්‍රටික්. සහ 'රිපබ්ලිකන්. යන ප්‍රධාන පක්ෂ දෙකෙහිම දේශපාලනයේ යෙදී ඇත. මැජික් ශිල්පියෙකු නොවුවත් ජීරබමප ගැන සඳහනක් කළ යුතුයැයි සිතුවෙමි.




James Antony Bailey සමග එක්ව The Greatest Show on Earth නම් තම දර්ශනය තුල; සර්කස්, මැජික් ඇතුළු අනෙකුත් ප්‍රසාංගික අංග සහ රොබෝ Autometa ඇතුළු ප්‍රදර්ශක භාණ්ඩ ඇමරිකාව සහ යුරෝපය පුරා තැනින් තැන රැගෙන ගියේය. Barnum's American Museum නමින් කෞතුකාගාරයක් ද ඔහු ආරම්භ කළේය.

1835 දි Joice Heth නම් වයස්ගත කළු-අමෙරිකානු වහල් කාන්තාවක් සුළු මුදලකට මිලට ගත් Barnum ඇය ප්‍රථම ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන් ළමාකල රැක-බලාගත් සේවිකාව බවත් 1674 දී උපන් ඇගේ වයස අවුරුදු 161ක් බවත් ප්‍රචාරය කර, ඇයව ප්‍රදර්ශනය කරමින් මුදල් ඉපයිය. (ඒ වනවිට 80 වන වියෙහි පමණ වූ ඇය, වැහැරී ගිය, වියලි සිරුරකින් යුතුවිය). කතාව තිර කිරීම සඳහා ඇය පැරණි දරු නැලවිලි ගී අපහසුවෙන් ගායනා කළ අතර ජෝර්ජ් වොෂින්ටන් ළමාකාලයේ සිදුවීම් සිහිකරමින් කතාකළ බවද කියවේ. කෙටි කලකදී Joice මියගිය අතර ඇගේ පස්චාත් මරණ පරීක්ෂණය සඳහා ද ප්‍රවේශපත්‍ර නිකුත් කළ Barnum, විශාල පිරිසක් රැස්කර ගත්තේය. පස්චාත් මරණ පරීක්ෂණාදී ඇයගේ වයස අවුරුදු 90 කට අඩු බව වෛද්‍යවරු ප්‍රකාශයට පත් කළහ. Barnum තම හපන්කම ගැන සතුටුවිය.

තවද, ඔහු Fiji Mermaid නමින් දියකිඳුරියකගේ වියලන ලද සිරුරක් ප්‍රදර්ශනය කළේය. පැසිෆික් සාගරයේ යාත්‍රාකළ නාවික කපිතාන් වරයකු විසින් අල්ලා ගත්, අතර මගදී මියගිය බව සඳහන් කළ මිනිස් උඩුකයකින් සහ මත්ස්‍ය යටිකයකින් සමන්විත වූ මෙම අපූරු නිදර්ශකය මුදල් ගෙවා නැරඹීමට ජනයා වැල නොකැඩී පැමිණියහ. පසුව එය මියගිය වඳුරෙකුගේ උඩුකය මත්ස්‍ය සිරුරක් හා ඉතා සූක්ෂම ලෙස බද්ධ කර කෘතිමව සකසා ගත් බොරු නිදර්ශකයක් බවට හෙළි විය.




බොරු පමණක් නොව ජනතා කුතුහලය දිනාගත හැකි හැකි මානව විකෘතීන් පවා ආකර්ෂණිය ලෙස ප්‍රදර්ශන භාණ්ඩ ලෙස ඔහු ඉදිරිපත් කළේය. සියම් නිවුන්නු Siamese Twins නම් ප්‍රකට් වූ බද්ධ නිවුන් මිනිසුන් ප්‍රදර්ශනය ආරම්භය ද ඔහුගේය.




*Have a great party and Christmas as well as a magical New Year*
- Andrew Haggar from UK

I wish you a merry christmas and a happy new year.
Say hello to the whole Circle.
Warm regards from Austria - Dino Dorado

**Merry Christmas from cold Switzerland.**
- Hörbi
Mr Cool

**Have a great Year end party. Merry Christmas & Happy New Year to all.**
Fred Rasmussen IBM Ring 216 San Jose, California

තවත් සුවිශේෂ ඉදිරිපත් කිරීමක් වන්නේ Charles Sherwood Stratton (1838-1883) නම් අඟල් 30 ක පමණ උසින් යුතු අඟුටුමිටි පුද්ගලයාය. තමන්ගේ ඥාති පවුලක වැඩීම හීන දරුවකු වූ Charles පිලිබඳ ආරංචිය ලද Barnum, ඔහුගේ පියා හමුවී Charles හදා-වඩා ගැනීමට බාරගෙන ඇත. පසුව නැටුම් ගැයුම් වැයුම් ආදී විවිධ හැකියාවන් පුහුණුකර ඉහල සමාජයේ කතා-බහ, සිරිත්-විරිත් අනුව මහත්මයෙකු ලෙස හැසිරීමට ද පුරුදු කළේය. ඔහුගේ සිරුරේ ප්‍රමාණයට ගැලපෙන ලෙස වටිනා ඇඳුම් උපකරණ පමණක් නොව කුරු අශ්ව පැටවුන් දෙදෙනෙකු යෙදූ අශ්ව කරත්තයක්ද නිමවා දී ඇත. 'General Tom Thumb' ලෙසින් නම් කළ මෙම පුද්ගලයා ඇමෙරිකාව යුරෝපය පුරා මහා ප්‍රසිද්ධියක් ලබා ගන්නා ලදී. Lavinia Warran නම් එවැනිම අඟුටුමිටි කාන්තාවක් සොයා විවාහ කර දුන් Barnum විවාහ උත්සවයට ද මාධ්‍ය හරහා විශාල ප්‍රසිද්ධියක් ලබා ගත්තේය. එම ප්‍රචාරය දිගටම පවත්වාගෙන ගොස් ඔවුන් දරුවන් ලද බවට බොරු ජායාරූප මගින් ප්‍රසිද්ධ කොට මුදල් උපයා ගත්තේය.




Barnum අපගේ ක්ෂේත්‍රය සමගද සම්බන්ධ චරිතයකි. 'නවීන මැජික් කලාවේ පියා. වන Robert Houdin මුල්කාලයේදී Paris Exhibition සඳහා ඉදිරිපත් කළ Writing Automata (ස්වයංක්‍රීයව රූප අඳින අකුරු ලියන රොබෝ උපකරණය) Barnum විසින් විශාල මුදලකට මිළටගන්නා ලද අතර එම මුදල සහ හිතවත් වංශාධිපතියෙකු වෙති ලද මුදලක් යොදවා Robert Houdin හට තම රඟහල සහ Soirees Fantastique මැජික් දර්ශනය ආරම්භ කිරීමට හැකිවිය. මෙයට අමතරව නදයබ උහජ්බ, Anton Kratky-Baschik, Eugene Verbeck, Ernesto Patrizio de Castiglione ආදී මැජික් ශිල්පීන් Barnum ගේ 'The Greatest Show on the World' සමග කටයුතු කළ බව සඳහන්යි



මම ව්‍යාපාරිකයෙකි. මගේ ව්‍යාපාරය ජනතාවට විනෝදය සැපයීමයි. මගේ ඉලක්කය 'මගේ සාක්කුව පුරවා ගැනීමයි.. මා ජනතාවට ඔවුන්ගේ මුදලේ වටිනාකම ලබා දී ඇත. විචාරකයන්, විවේචකයින් සහ මාධ්‍ය මා ගැන හොඳ හෝ නරක කීවාට කමක් නැත. මා ගැන මාධ්‍ය තුල මොනවා හෝ කියවෙනවානම් ඒ මට ලැබෙන ප්‍රචාරයකි."



Entertainment Business' තුල මහා ධනවතෙකු බවට පැමිණි ලොව පළමු වන්නා P. T. Barnum ය. මිනිසුන් පිළිගන්නට ආස කරන දේ බොරුවට දක්වා ඔවුන් පහසුවෙන්ම මුලාකළහැකි බවට වන සංසිද්ධිය" නුතන මනෝ විද්‍යාවේ දැක්වෙන්නේ 'Barnum Effect' යනුවෙනි. බොරුව විකුණා ධනවත් වීමේ තම හපන් කම ගැන උදම් අනන Barnum 'ලෝකයේ සැම මොහොතකම මෝඩයෙක් උපදී. යනුවෙන් ප්‍රකාශ කර ඇතැයිද සඳහන්ය.



"Barnum Effect' මගින් විශාල වශයෙන් මුදල් උපයාගෙන, ධනවත් වූ අය අපේ සමාජයේද විය.... අදටත් සිටි.............................

# A letter from Sunny California



Hi Devsiri:

Thanks for your response to me asking about my activities in California. It doesn't seem that long ago when I visited SRI Lanka Magic Circle January 27, 2013. I am still appreciative of the time I spent with you and your group.

I have been directing our IBM Ring 216 Senior Retirement Center Magic shows in the SF Bay area. I initiate about 4 shows a year and have six acts that run a total of 45 minutes. 'My stage Manager and I organize the set-up of curtains and audio equipment and we both perform. I rotate asking different Ring 216 Magicians to perform providing a total of 6 acts for each show. (see Photo below)



**Oceania cruise ship Parlor show 2015**

Our San Jose IBM Ring has about 50 members, we hold monthly meetings incorporating: Walk-around, Close-up and Stage magic competitions, lecturers by top US Magicians, an Auction and Open performances for members to try new Magic. See Ring 216 Web site at **www.ring216.org**

My wife and I take several trips to different parts of the world each year and I do magic for the tour groups and on Cruise ships. In addition to your group I have visited and performed at the College of Magic in Cape Town, S. A., Ring 215 in Singapore, Magic Centers in Istanbul & Ismil Turkey, met Alan Watson in New Zealand and visited magic shops in Europe.

It is a wonderful Brotherhood we magicians have and I hope we can keep in touch.



**Kids love the Finger Chopper in West Africa 2015**



**Sunnyvale California Magic & Wine Festival Summer 2017**

Please contact me if you come out to California.

**Fred Rasmussen**

**Past President Ring 216**


# Annual General Meeting

**Notice is hearby given that the Annual General Meeting 2018 will be held on Sunday 11th February 2018. Members in arrears of membership fees are urged to make payment without further delay.**
**Col. Ronald de Alwis**
**Secretary General**

# Resolutions

**Resolutions to be tabled at the Annual General Meeting 2018 should reach the Secretary General by 28th January 2018. They may be sent by post or email.**

## Happy Birthday to all members celebrating their birthdays in December



| | | |
|---|---|---|
| December | 2 | A.D. Gunsekera |
| December | 9 | Wimhelm Perera |
| December | 18 | Trevor J. Anthony |
| December | 19 | Trevin Hannibal |
| December | 22 | Noel Ananda |
| December | 23 | Udara Ariyasinghe |
| December | 25 | Ms. K.A.D. Pushpakanthi |
| December | 27 | Sumangala Silva |
| December | 29 | Keerthi Weerawardena |

## Magic Dealer from Hydrebad Ashok Kumar will be there on 28th January

# මැජික් බඩු අලවිය




**Here are some of the goods and their prices**

**1.Cane to two fans-800(INR) 2.Candle to fan-400 3.Cabbage flowers-450**

**4.Gaint flowers-450 5.Spring flower-300 6.Spring flower jumbo-450**

**7.Bhare hand flowers-150 8.Bhare hand flowers-200**

**9.Body loads fans-500 10.Thumb tip blendo-150 11.mirror effect-2500**

**12.Dye tube-350 All rates are Indian rupees.1 Indian Rupee is roughly 2.40 Sri Lanka Rupees**

**For details contact President Rohan.**

# Flashback to January 2013



Members may recall the visit by Fred Rasmussen on 28th January 2013. Fred honoured us with a brief but eventful visit. Many of our Members performed during that visit. In turn Fred too performed and tutored us regarding some of the tricks he did. A pencil sketch of him was done by Dinesh which took all of us by surprise especially Fred. Hope we will have another “special day” like that in the future.









On with the SLMC Party











THE WAND

If undelivered please return to

Devsiri Fernando
No. 7, Francisco Place,
Moratuwa.